# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1877/58 - 2014 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2014.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ගම්පොල නියංගම්පාය රජමහා විහාර පූජනීය ප්‍රදේශය**
**පූජාභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

අංක 1681/3 හා 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා අති විශෙෂ ගැසට් පත්‍රයේ
පළ කරන ලද නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1681/3 - 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා ප්‍රසිද්ධ කරන ලද අතිවිශෙෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ආචාර්ය දිසානායක මුදියන්සේලාගේ ජයරත්න වන මා හට පැවරී ඇති පූජාභූමි සැලසුම්කරණය හා සංවර්ධනය විෂයය ප්‍රකාරව මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් බවටත් එය ''ගම්පොල නියංගම්පාය රජමහා විහාරපූජාභූමිය" යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය දි.මු. ජයරත්න,
බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍ය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය,
අංක 135, අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

*උපලේඛනය*

*ගම්පොල නියංගම්පාය රජමහා විහාර පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය*

මිනින්දෝරු ජනරාල්ගේ 2014.03.19 වැනි දින අංක 320059 දරන කැඩැස්තර සිතියමේ නිරූපිත මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත - ගම්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟ ඉහළ කොරළේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 3.78 විශාලත්වයෙන් යුතු පහත දැක්වෙන පරිදි මායිම් වූ මුළු ප්‍රදේශය.

**කැබලි අංකඃ-1ඃ8(ක.සි.320059,කලාප01,පත්‍ර01)**

| | |
|---|---|
| උතුරට | : ක.සි.320059 හි පත්‍රය 2 ; |
| නැගෙනහිරට | : කැබලි අංක 1ඃ7,1ඃ11,1ඃ18,1ඃ19,1ඃ24,1ඃ25 සහ 1ඃ33; |
| දකුණට | : කැබලි අංක 1ඃ33,ක.සි.320059 හි පත්‍රය 2 සහ කැබලි අංක1ඃ10; |
| බස්නාහිරට | : ක.සි.320059 හි පත්‍රය 2 සහ කැබලි අංක1ඃ9. |

1A - G 20156 — 50 (2014/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කැබලි අංකඃ-1ඃ98(ක.සි.320059,කලාප01,පත්‍ර02)**

| | |
|---|---|
| උතුරට | ඃ කැබලි අංක1ඃ101,1ඃ99; |
| නැගෙනහිරට | ඃ කැබලි අංක1ඃ99,1ඃ8 සහ1ඃ9; |
| දකුණට | ඃ කැබලි අංක1ඃ9,1ඃ47; |
| බස්නාහිරට | ඃ කැබලි අංක1ඃ47,1.101. |

09 - 481

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.